# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,497 — 1965 සැප්තැම්බර් 4 වැනි සෙනසුරාදා — 1965.9.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

### මිල පාලන දැන්වීම්

කේ. ඇල්. 109 දරණ ආහාර මිළ නියෝගය — අතිරේක ආහාර ද්‍රව්‍ය මසූර් පරිප්පු

### මිළ පාලන පනත

#### නියෝගය

කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් චාර්ල්ස් සැමසන් රණසූරිය වන මම (173 වැනි අධිකාරය වන) 3 (2) වගන්තිය මිළ පාලන පනත හා කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

1. 1963 අගෝස්තු 30 වැනි දින අංක 13,744 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1963 අගෝස්තු 27 වැනි දින හා අංක කේ. ඇල්. 101 දරණ ආහාර මිළ නියෝගය මේ දැන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

2. මීට යාකර ඇති 1 වැනි උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල විස්තර කර ඇති පරිදි පිටරටින් ගෙනෙන ලද පාහින ලද මසූර් පරිප්පු 1 වැනි වර්ගය සහ මෙරට පාහින ලද මසූර් පරිප්පු 2 වැනි වර්ගය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දළබර හොණ්ඩරයක් එකී පළවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ ඇති ප්‍රදේශවලින් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් මේ උපලේඛනයේ 2 වැනි 3 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

3. මීට යාකර ඇති දෙවැනි උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල විස්තර කර ඇති පරිදි පිටරටින් ගෙනෙන ලද පාහින ලද මසූර් පරිප්පු 1 වැනි වර්ගය සහ මෙරට පාහින ලද මසූර් පරිප්පු 2 වැනි වර්ගය සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට එකී දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ ඇති ප්‍රදේශවලින් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් එකී දෙවැනි උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

4. තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 2 වැනි හා 3 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

5. එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

6. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.


1307——ආර් 8520—7,025 (65/8)



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

7. එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා." යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව ද නියම කරමි.

8. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් ම මිළයට ගන්නා ඉල්ලුම්කරුගේ පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

9. උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, එම උපලේඛනයේ සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බව ද නියම කරමි.

1965 අගෝස්තු 31 වැනි දින කළුතර කච්චේරියේ දී පෙරවරු 9 ට අත්සන් කරන ලදී.

සී. ඇස්. රණසූරිය,
කළුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

## පළමුවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ග්‍රාම සේවක කොට්ඨාශ අංක | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය | 2 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළබර ගෝණියක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ පිටරටින් ගෙනෙන ලද පාහින ලද මසූර් පරිප්පු 1 වැනි වර්ගය<br>රු. ශ. | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළබර ගෝණියක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ මෙරට පාහින ලද මසූර් පරිප්පු දෙවන වර්ගය<br>රු. ශ. |
|---|---|---|---|
| 604 සිට 655 දක්වා ... | රයිගම් කෝරළය ... ... | 53 85 ... | 44 05 |
| 656 සිට 713 දක්වා ... | පානදුර තොටමුණ ... ... | | |
| 714 සිට 770 දක්වා ... | කළුතර තොටමුණ ... ... | | |
| 771 සිට 810 දක්වා ... | බටහිර පස්දුන් කෝරළය ... | 54 15 ... | 44 35 |
| 811 සිට 825 දක්වා ... | ගඟබඩ පත්තුව ... ... | | |
| 826 සිට 850 දක්වා ... | මහපත්තුව ... ... | | |

## දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ග්‍රාම සේවක කොට්ඨාශ අංක | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය | 2 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ පිටරටින් ගෙනෙන ලද පාහින ලද මසූර් පරිප්පු 1 වැනි වර්ගය<br>රු. ශ. | 3 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ මෙරට පාහින ලද මසූර් පරිප්පු 2 වැනි වර්ගය<br>රු. ශ. |
|---|---|---|---|
| 604 සිට 655 දක්වා ... | රයිගම් කෝරළය ... ... | 0 53 ... | 0 44 |
| 656 සිට 713 දක්වා ... | පානදුර තොටමුණ ... ... | | |
| 714 සිට 770 දක්වා ... | කළුතර තොටමුණ ... ... | | |
| 771 සිට 810 දක්වා ... | බටහිර පස්දුන් කෝරළය ... | 0 53½ ... | 0 44½ |
| 811 සිට 825 දක්වා ... | ගඟබඩ පත්තුව ... ... | | |
| 826 සිට 850 දක්වා ... | මහ පත්තුව ... ... | | |

සටහන.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකි ය.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය අංක 61/9/197

ආදයම් රක්ෂණ ආඥපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥව අනුව, 1965 සැප්තැම්බර් මස 6 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... ... | 1 63 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 06 |

අංක ඒ 781.
1965 සැප්තැම්බර් මස 4 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

ඩබ්ලිව්. පත්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

9-411

---

## රේගු දැන්වීම අංක 64/5/57

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 සැප්තැම්බර් මස 6 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 199 1/2 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 251 26 ... | 221 43 ... | 188 04 ... | 62 82 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වේ.

අංක ඒ 744/22.
1965 සැප්තැම්බර් මස 4 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

ඩබ්ලිව්. පත්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

9-412

---

ලංකාවේ සැලසුම් දෙපාර්තමේන්තුවේ "රිසර්ච් පේපර් මිල්ස් කෝපරේෂන්" සමාගම නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි